## දෙසතියක ඇරඹුම

2017 .10.09 - 2017.10.22

අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් එක් ශාඛා මඟින් පැවැත්වීමට නියමිත උත්සව හා විශේෂ වැඩසටහන්

## කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

### ඔක්තෝබර් 06 - 12

"එක්වෙමු නැගිටිමු අටුකොටු පුරවමු" ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාම සතියක වැඩසටහන (ගොවි දිනය, සිසු දිනය, පශු සම්පත් දිනය ව්‍යවසායකත්ව දිනය, ධීවර දිනය, රාජ්‍ය සේවක දිනය, දියවර දිනය) සිසු දිනය ඔක්තෝබර් 7 ගම්පහ දොම්පේ සියනෑ ජාතික පාසලේදී ගරු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගේ සහ ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ඩී. රාධක්‍රිෂ්ණන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත්/කලාප/අධ්‍යපන දෙපාර්තමේන්තු නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.







## ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව

### ඔක්තෝබර් 09

පාසල් දරුවන්ගේ ඉංග්‍රීසි සාහිත්‍ය විෂය දැනුම වර්ධනය කිරීම උදෙසා අ.පො.ස. (උ.පෙ.) ඉංග්‍රීසි විෂය හදාරන සිසුන් සඳහා ජාතික මට්ටමේ රූපවාහිනී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනට (Lit-Q) ළමුන් තෝරා ගැනීමේ විභාගය පැවැත්වේ.

## ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව

### ඔක්තෝබර් 09

ක්‍රියාකාරකම් කාමරය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරකම් ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීම පිළිබඳව ප්‍රාථමික අධ්‍යාපන විෂයභාර නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේදී පැවැත්වේ. (සිංහල හා දෙමළ මාධ්‍ය)



## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

### ඔක්තෝබර් 09, 10

තොරතුරු තාක්ෂණයේ නව ප්‍රවණතා සහ අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ නව භාවිතය සම්බන්ධයෙන් පළාත්, කලාප තොරතුරු තාක්ෂණ විෂය අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව ඔක්තෝබර් 09 වැල්ලවත්ත මිරාජ් හෝටලයේදී සහ ඔක්තෝබර් 10 සිනමන් ලේක්සයිඩ් හෝටලයේදී පැවැත්වේ.



## ගණිත ශාඛාව

### ඔක්තෝබර් 09, 10

ජාතික හා පළාත් ඒකාබද්ධ නියාමන හා අධීක්ෂණය සඳහා ක්‍රියාත්මක රාමුවක් සැකසීම මෙම වැඩසටහන නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වෙන අතර නේවාසික දින 2ක වැඩමුළුවකි..

## නැණසස ඒකකය

**ඔක්තෝබර් 09**

ද්වී භාෂා මාධ්‍ය විෂයයන් සඳහා විෂයානුබද්ධ මෘදුකාංග සකස් කිරීමේ ආරම්භක වැඩසටහන නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## විෂය සමගාමී මාර්ගෝපදේශ-උපදේශන ශාඛාව

**ඔක්තෝබර් 09 - 12**

විෂය සමගාමී විෂය භාර නියෝජ්‍ය විදුහල්පති පුහුණු කිරීමේ වැඩමුළුවක් මීපේ නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## ගණිත ශාඛාව

**ඔක්තෝබර් 09 - 13**

අන්තර් ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලිය - 2017 ගණිත අංශයෙන් නියෝජනය කරන සිසුන් පුහුණු කිරීමේ වැඩමුළුවක් මීපේ නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## සාමය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යාපන ඒකකය හා දෙමළ පාසල් සංවර්ධන ශාඛාව

**ඔක්තෝබර් 09 - 13**

සාමය හා සංහිඳියා කාර්යාංශය සමඟ එක්ව සංවිධානය කරනු ලබන සහෝදර පාසල් වැඩසටහන යාපනය මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්වේ. මේ සඳහා නැගෙනහිර, බස්නාහිර , උතුර හා දකුණු පළාත් වල පාසල් ළමුන් 200ක් සහභාගි වේ. අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේ හා ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණියගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.



## වතු පාසල් සංවර්ධන ශාඛාව

**ඔක්තෝබර් 10**

තෝරාගත් වතු පාසල් 32ක් සඳහා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් ලබා දීමේ උත්සවය අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේදී පැවැත්වේ.

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

**ඔක්තෝබර් 10, 11**

සීමිත තරඟ විභාග ප්‍රතිඵල මත බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ දෙමළ මාධ්‍ය නවක නිලධාරීන් සඳහා තොරතුරු හා තාක්ෂණ විෂය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන තලාහේන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වේ.



## ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව

**ඔක්තෝබර් 10,11,12**

ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන දැනුම මොඩියුලයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේදී පැවැත්වේ.

## නැණසස ඒකකය

**ඔක්තෝබර් 10-13**

අ.පො.ස. (උ.පෙළ) හඳුනාගත් විෂයන් 6ක් සඳහා විෂයානුබද්ධ අන්තර්ගත සැකසීමේ වැඩසටහන නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

**ඔක්තෝබර් 10,14**

2017 සමස්ථ ලංකා දෙමළ භාෂා තරගාවලියේ සම්මාන ප්‍රදානෝත්සවය යාපනය හින්දු විද්‍යාලයේදී පැවැත්වේ. මෙම වැඩසටහන ගරු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගේ සහ ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ඩී. රාධක්‍රිෂ්ණන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

## ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව

**ඔක්තෝබර් 11,12,13**

ප්‍රාථමික සිසුන්ගේ හඳුනාගත් ඉගෙනුම් දුෂ්කරතා වලට මැදිහත් වීම සඳහා වූ සුවිශේෂී ඉගෙනුම් ක්‍රමවේදයන් හා ශිෂ්‍ය තොරතුරු වාර්තා පිළිබඳ පළාත් ප්‍රාථමික අධ්‍යාපන සම්පත්දායකයින් පුහුණු කිරීමේ වැඩමුළුවක් මීපේ නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වේ. මේ සඳහා ළමා රෝග හා ළමා මනෝරෝග විශේෂඥ වෛද්‍යවරුන් සහභාගි වේ.

## නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව

**ඔක්තෝබර් 12,13**

අකුරු, ගණිත සංජානන හැකියාව අඩු සිසුන් හා අල්ප දෘෂ්ඨිකතාවය සහිත සිසුන් සඳහා රජයේ දැනට නිර්දේශිත මව්බස හා ගණිතය, සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පෙළපොත් අකුරු විශාලනය කර නැවත ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහනක් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු රුස්වීම් ශාලාවේදී පැවැත්වේ.



## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පාසල් විභාග සංවිධාන ශාඛාව

### ඔක්තෝබර් 13

අ.පො.ස. (සා.පෙළ) - 2017 පළාත්/කලාප විෂයය අධ්‍යක්ෂවරුන්ගේ උපදෙස් රැස්වීමක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නව රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

## ගණිත ශාඛාව

### ඔක්තෝබර් 13,15

ලාෆ් හෝල්ඩින් ව්‍යාපාරය සමග සහයෝගිත්වයෙන් පවත්වනු ලබන ගණිත කඳවුර පැරැලිය ජිනරතන මහා විද්‍යාලයේදී පැවැත්වේ.

## ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

### ඔක්තෝබර් 15

අන්තර් ජාතික වශයෙන් පවත්වනු ලබන මිට්ෂුබිසි ආසියානු ළමයින්ගේ "ඉනික්කි නෙස්ටා" චිත්‍ර තරගය දේශීයව සංවිධානය කිරීමේ වැඩසටහන කොළඹ දේවි බාලිකා විද්‍යාලයේදී පැවැත්වේ. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා සහ අධ්‍යාපන ලේකම්තුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.



## අධ්‍යාපන ආර්ථික සංවර්ධන වැඩසටහන ESDP/SMTSU

### ඔක්තෝබර් 16

PSC Meeting with PDEs and PSEs වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේදී පැවැත්වෙන අතර අධ්‍යාපන ලේකම්, අධ්‍යාපන අධ්‍යක්ෂවරු , පළාත් අධ්‍යාපන ලේකම්වරු, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු, අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය, කොමසාරිස් (NETS) අධ්‍යක්ෂ ජනරාල් (ERD) අධ්‍යක්ෂ ජනරාල් (PMM) යන නිලධාරීන් සහභාගිවනු ඇත.

## වාණිජ හා ව්‍යාපාර අධ්‍යනය ශාඛාව

### ඔක්තෝබර් 16,17

බස්නාහිර පළාත් පාසල් වල අ.පො.ස. (උ.පෙළ) ආර්ථික විද්‍යා ගුරුවරුන් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව

### ඔක්තෝබර් 16,17,18,19

විශේෂ අධ්‍යාපන වෘත්තිකයන් සඳහා බේල් හා සංඥා භාෂා පුහුණු වැඩසටහන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වේ.



## නැණස ඒකකය

### ඔක්තෝබර් 16-20

අ.පො.ස. (උ.පෙළ) 12 ශ්‍රේණිය නැණස අධ්‍යාපනික නාලිකාව සඳහා ගුරුවරු තෝරා ගැනීමේ ආරම්භක වැඩසටහන නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## නැණස ඒකකය

### ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලදී

අධ්‍යාපන අමාත්‍යාංශයේ Digital Learning Experience මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ගුරුවරුන් දැනුවත්කිරීමේ වැඩසටහන් මාලාවක් බත්තරමුල්ල ලංකා සභා විද්‍යාලයේදී සහ කෝට්ටේ ආනන්ද බාලිකා විද්‍යාලයේදී පැවැත්වේ.

## ගණිත ශාඛාව

### ඔක්තෝබර් 19,20

සමස්ථ ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය 2017 මීපේ නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේදී අතිරේක ලේකම් ආචාර්ය මදුරා වෙහැල්ල මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. .




## වාණිජ හා ව්‍යාපාර අධ්‍යනය ශාඛාව

### ඔක්තෝබර් 19,20

වාණිජ විෂය ධාරාව සම්බන්ධයෙන් ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව නිවාස සැලසුම් හා අභ්‍යාස ආයතනයේදී පැවැත්වේ.

## ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව

### ඔක්තෝබර් 19,20,21

නැගෙනහිර පළාත් ජාතික පාසල් ගුරුභවතුන්හට "සති පාසල්" වැඩමුළුව නැගෙනහිර පළාතේදී පැවැත්වේ.(ත්‍රිකුණාමලය,මඩකලපුව,අම්පාර)

## ගුරු ආයතන ශාඛාව

### ඔක්තෝබර් 20

විද්‍යාපීය ශික්ෂණ ඩිප්ලෝමාධාරීන් වෙත ගුරු පත්වීම් ප්‍රධානය ගරු අග්‍රාමාත්‍ය තුමා, ගරු අධ්‍යාපන ඇමති තුමා, ගරු රාජ්‍ය ඇමති තුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පැවැත්වේ.

සැකැසුම - සංඛ්‍යාලේඛන අංශය